**ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව**
**2016 වර්ෂය**

---

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 31 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-------------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,520.77 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,469.71 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 51.06 ක් හෙවත් සියයට 3.36 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,041.58 | 1,027.95 | 13.63 | 1.31 |
| මූලධන | 479.19 | 441.76 | 37.43 | 7.81 |
| **එකතුව** | **1,520.77** | **1,469.71** | **51.06** | **3.36** |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත 20.02.01.01 සඳහා එකතුව රු.මිලියන 750.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 789.53 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 105.27 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉක්මවීම/ (ඌනතාවය) ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.02.01.01 | 750.00 | 789.53 | 39.53 | 5.27 |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 13001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 85.00 | 54.82 | 24.00 | 25.28 | 133.00 | 105.07 |

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 5 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 17.557 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0056/000 | 0.210 |
| 6000/0000/00/0013/0045/000 | 5.860 |
| 6000/0000/00/0016/0025/000 | 11.130 |
| 6000/0000/00/0018/0033/000 | 0.004 |
| 6000/0000/00/0002/0074/000 | 0.353 |
| **එකතුව** | **17.557** |

## 2.5 විගණන නිරීක්ෂණය

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

### 3.1 විසර්ජන ගිණුම

---

#### 3.1.1 අයවැය විචලනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 5 ක් සඳහා සලසා තිබුණු රු. 19,853,600 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.12,477,921 ක් උපයෝජනය කළ පසු රු.7,375,679 ක් ඉතිරි වී තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ක සිට සියයට 74 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 චක්‍රලේඛයේ (2) ඡේදය ප්‍රකාරව අයවැය ඇස්තමේන්තුව මඟින් සලසා ඇති වියදම් සීමාව තුළ වියදම් කළමනාකරණය කළ යුතු වුවත් ඊට පටහැනිව 130-1-5-2401 වැය විෂයය සඳහා රු. මිලියන 45.7 ක අතිරේක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. අතිරේක ප්‍රතිපාදනය මුල් ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 304 ක් විය.

### 3.2 ආදායම් ගිණුම්

---

අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේත 20.02.01.01 ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **20.02.01.01 දරන ආදායම් සංකේතය - රජයේ ගොඩනැගිලි කුලී**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට අදාළව රු.මිලියන 750.00 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 789.53 ක් රැස්කර තිබුණු අතර එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 105 ක් විය.

(ii) ආදායම් ගිණුම අනුව එකතුව රු.221,227,142 ක ආදායම් හිඟහිට තිබුණු අතර, එම හිඟහිටි ආදායම වර්ෂ 01ක සිට වර්ෂ 10 ක් අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(iii) 2015 වර්ෂය වෙනුවෙන් හිඟහිටි ආදායම රු.1,214,529 ක් හා 2014 වර්ෂය හා ඉන් පෙර වර්ෂයන් වෙනුවෙන් හිඟ ආදායම රු.4,408,111 ක් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී හිඟහිටි ආදායම් වශයෙන් රු.5,622,640 ක් අළුතින් වාර්තා වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් මගින් ආදායම් ශීර්ෂ 10කට අදාළ ගොඩනැගිලි කුලී

ආදායම රු.744,014 ක් ලෙස හඳුනාගෙන තිබුණද, එම ශීර්ෂයන්ගේ හිඟ ආදායම් වාර්තා හා ආදායම් වාර්තා යනාදිය ලබා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් හිඟහිටි ආදායමෙහි නිවැරදිතාව සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය.

(iv) ආහාර දෙපාර්තමේන්තුවෙන් 2017 ජුලි 31 දිනට අයවිය යුතු හිඟ කුලිය රු.46,527,303 ක් විය.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 13001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක සිට වර්ෂ 05කට වැඩි කාල පරාසයක සිට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 5,107,460 ක් විය. මෙම ණය ශේෂ තුළ මිය ගිය, සේවය අතහැරගිය , ද්විතීයනය පදනම මත මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ පිළිවෙලින් රු.33,691ක්, රු.600,339ක් හා රු.1,150,837ක් වූ අතර එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

(i) ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා 2000 නොවැම්බර් 02 දිනැති අංක අමප/00/1848/23/019 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිකරන ලද නිවාස 20 ක ඉදිකිරීම් කටයුතු 2006 වර්ෂයේදී අවසන්ව තිබුණි. එම ඉදිකිරීම් කටයුතු අවසන් වීමෙන් පසුවද ශ්‍රී ලංකා විදේශ සේවයේ නිරත නිලධාරීන් වෙත වෙන් කර දී ඇති අමාත්‍යාංශය සතු නිවාස 07 පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) අනවසරයෙන් ආගමික මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශයට අයත් බොරැල්ල කොටා පාරේ පිහිටි නිවාස දෙකක් වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වරිපනම් බදු ලෙස රු.32,208 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, එම නිවාස දෙක අමාත්‍යාංශය භාරයට ගෙන අමාත්‍යාංශයේ කටයුතු වලට යොදා ගැනීමට 2017 අගෝස්තු 04 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 13 ක් යටතේ රු.327,908 ක් වූ ඉතිරිවීම වෙනුවෙන් රු. 2,140,869 ක් වූ බැරකම්වලට එළඹ තිබුණු අතර මුදල් රෙගුලාසි 94(2) විධිවිධාන ප්‍රකාරව ඉඩදී තිබූ සීමාව ඉක්මවා රු.1,812,961 ක් වූ බැරකම්වලට එළඹ තිබුණි.

(ii) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 4.2 වගන්තිය අනුව ශුන්‍ය පාදක ප්‍රවේශය අනුගමනය කළ යුතු බව අවධාරණය කර ඇතත් ඊට අනුකූල නොවන ලෙස අවස්ථා 397 කදී වැය විෂයයන් 13 ක් සඳහා රු4,172,961.ක් වූ බැරකම්වලට බැඳීම් ඇති කර ගෙන තිබුණි.

**3.5 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**--------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XIXපරිච්ඡේදය 6.1 සහ 7.2 වගන්ති | නිවාස 05 ක පදිංචිකරුවන් සම්බන්ධයෙන් මෙම වගන්ති අනුව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 104(4) | අලාභහානි 04 කට අයත් එකතුව රු.3,248,456 ක් මාස 3ක සිට වර්ෂ 7කට වැඩි කාලයක් ඉක්මවා තිබුණද, එම අලාභහානි සම්බන්ධව පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1642 | සමාලෝචිත වර්ෂයේ දී වාහන 13ක් අවස්ථා 15කදී අනතුරුවලට භාජනය වී තිබුණි. ඒ සම්බන්ධව ප්‍රමාණවත් පරීක්ෂණ පැවැත්වීම, වරදකාර පාර්ශවය හඳුනාගැනීම සහ අලාභ පියවා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

(ඇ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

--------------------

2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන චක්‍රලේඛය

අත්තිකාරම් ලබා දිය යුත්තේ අදාළ අරමුණ ඉටු කරන දිනයට ආසන්නම දිනයේදී වුවත්, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ කාර්ය ආරම්භ වීමට දින 05ක සිට දින 22ක කාලයකට පෙර සිට අත්තිකාරම් ලබා දී තිබුණි. එසේම අදාළ කාර්ය නිම වූ වහාම දින 10ක කාලයක් ඉක්ම යාමට ප්‍රථම අත්තිකාරම් පියවිය යුතු වුවත්, පියවීම් දින 17 ක සිට දින 80 ක් දක්වා ප්‍රමාදයකින් පසු පියවා තිබුණි.

(ඇ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ I කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 195 සහ හි සහ 203 හි කොන්දේසිය

(i) ගණකාධිකාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතර, එකම සේවා ස්ථානයක වර්ෂ 05ක සිට වර්ෂ 16කට වැඩි කාලයක් දක්වා නිලධාරීන් 670ක් සේවයේ යොදවා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ 04 ක රාජ්‍ය කළමනාකරණ සේවයේ සහ අනිකුත් සේවාවන් 05 ක වාර්ෂික ස්ථානමාරු සම්බන්ධයෙන් ඉදිරිපත් වූ තොරතුරු අනුව සෑම වර්ෂයකම ස්ථානමාරු අයදුම්පත් ඉදිරිපත් කළ සංඛ්‍යාවෙන් සියයට 50 කට අඩු අයදුම්කරුවන් සංඛ්‍යාවක් සඳහා පමණක් ස්ථාන මාරුවීම් ලබාදී තිබුණි.

**3.6 විදේශාධාර ව්‍යාපෘති**

------------------------

2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා දුෂ්කර ප්‍රදේශයන්හි ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන කටයුතු වෙනුවෙන් අවශ්‍ය ධාරිතාව සංවර්ධනය සඳහා විදේශ මූල්‍යනය ව්‍යාපෘතියට 2016 දෙසැම්බර් 31 දින දක්වා UNDP ව්‍යාපෘතිය මගින් ලැබී තිබූ ප්‍රදාන වටිනාකම ඇමරිකානු ඩොලර් 727,729 ක් විය. තවද, 2016 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.4,000,000ක් වී තිබුණි. එම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.3,983,696 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණු අතර ත්‍රෛමාසික කාර්යය සාධන වාර්තා විගණනයට ඉදිරිපත් නොවූ බැවින් ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවල කාර්යසාධනය ප්‍රමාණනය කළ නොහැකි විය.

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 625(1) (ආ) ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගතයුතු වුවද ව්‍යාපෘතිය සතු රු. 11,401,370 ක් වටිනා ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.

**3.7 දේශිය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**-----------------------------------------------------**

2006 වර්ෂයේදී නිවාස 1452 කින් යුතු නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර තිබුණු අතර, 2012 වර්ෂය අවසාන වන විට නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම ඉංජිනේරුමය කටයුතු පිළිබඳ උපදේශක කාර්යාංශය සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව යන ආයතන වෙත එකතුව රු.5,019,262 ක මුදලක් ගෙවා තිබුණද, 2017 අප්‍රේල් මාසය දක්වාම මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

**3.8 කාර්යසාධනය**

**-----------------**

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී අපේක්ෂිත අරමුණු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක කර තිබූ ක්‍රියාකාරකම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය තහවුරු කර ගැනීමට තොරතුරු ලබා ගතහැකි ආකාරයට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) සකස් කර තිබූ ප්‍රගති වාර්තාව පරීක්ෂා කිරීමේදී පහත සඳහන් බැහැරවීම් නිරීක්ෂණය විය.

(i) කණ්ඩායම් ගොඩනැගීමේ හා නායකත්ව පුහුණු සඳහා බැහැරගත පුහුණු පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් රු.මිලියන 1 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණද රු. මිලියන 0.124 ක් වැය කරමින් නිලධාරීන් 34 දෙනෙකු සඳහා වැඩසටහන් පවත්වා තිබුණි. එහි මූල්‍ය ප්‍රගතිය සියයට 68 ක් පමණක් විය.

(ii) කාර්මික පුහුණු සහ නිලධාරීන් 200 ක් සඳහා කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් හා කෙටි කාලීන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 1 ක් වෙන් කර ඇතත් එම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) දීප ව්‍යාප්ත සේවාවන් 06 ක් ඇතුළුව සේවාවන් 13 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය 102,596 ක් වූ අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට එයින් තනතුරු 11,454 ක් පුරප්පාඩු පැවතුණි. ඒ අනුව වාර්ෂිකව පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3.9 අවිධිමත් ගනුදෙනු

-----------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

--------------------------------------------------------------------------

ජාතික එලදායිතා සම්මාන උළෙල පැවැත්වීම සඳහා ඇස්තමේන්තුගත රු. මිලියන 15 ට අමතරව, අතිරේක ප්‍රතිපාදන සහ පරිපූරක ඇස්තමේන්තු මගින් රු. මිලියන 45.7 ක්ද ලබාගෙන රු.මිලියන 60.22 ක් වියදම් දැරීම පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2016 සැප්තැම්බර් මාසයේදී ශාලා පහසුකම් සඳහා මිල ගණන් ලබා ගැනීම සිදු කර තිබුණ ද, 2016 අගෝස්තු මාසයේදී ඉසව් කළමනාකරු තෝරා ගැනීම සඳහා වූ පුවත්පත් දැන්වීමෙහි සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම සඳහා රත්මලාන ස්ටයින් ස්ටූඩියෝ ශාලාව තෝරාගෙන ඇති බවට සඳහන් කර තිබීම හේතුවෙන් ශාලා පහසුකම් සඳහා මිල ගණන් කැඳවීමට පෙර ලබාගන්නා ස්ථානය තීරණය කර තිබුණි.

(ii) ඉහත කරුණු සම්බන්ධයෙන් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 1.2.1 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

- ඉසව් කළමනාකරුවෙකු තෝරා ගැනීම වෙනුවෙන් අඩුම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයට වඩා ඉහළ මිලක් ඉදිරිපත් කර තිබූ ආයතනයක් වෙත ටෙන්ඩරය පිරිනමා තිබීම හේතුවෙන් රු. 1,611,600 ක් වැඩියෙන් ගෙවීමට සිදුව තිබූ අතර තෝරා ගැනීමට විශේෂිත වූ හේතු දක්වා නොතිබුණි.
- එලදායිතා විනිශ්චය කටයුතු වෙනුවෙන් පාවිච්චි කළ වාහන සඳහා අවස්ථා 60කදී පෞද්ගලික ආයතනයකට රු.5,219,048 ක් ගෙවා තිබුණු අතර, වියදම් අවම කර ගැනීමේ විකල්ප ක්‍රියාමාර්ගයක් වශයෙන් අමාත්‍යාංශයේ වාහන ලබා ගැනීමට විමසීමක් සිදු කර නොතිබුණි.

### (ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු

-----------------------------------------

එලදායිතා ලේකම් කාර්යාලය විසින් නිලධාරියෙකුගෙන් රු.15,000ක මුදලක් අයකර එලදායිතාවය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් ක්‍රියාත්මක කර තිබුණි. 2016 වර්ෂයේදී එලදායිතා ලේකම් කාර්යාලයේ සංවර්ධන සහකාර තනතුරෙහි සේවයේ නියුතු නිලධාරීන් 28 දෙනෙකු මෙම පාඨමාලා හදාරා තිබුණි. නමුත් ඔවුන්ගෙන් මුදල් අයකර නොතිබුණු අතර ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.10 කළමනාකරණ දුර්වලතා**

2016 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයට අයත් නිවාසවලින් අයවිය යුතුව තිබූ හිඟ කුලී ආදායම රු.මිලියන 55.18 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් අයවිය යුතු හිඟ කුලී රු.මිලියන 36.04 ක් වශයෙන් සඳහන් වුවද කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු හිඟ කුලී ශේෂය රු.මිලියන 7.47 ක් බව නිරීක්ෂණය විය. මෙම ආයතනය ගොඩනැගිල්ලෙන් ඉවත්ව ඇතත් හිඟ කුලී අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රී / ඇමතිවරු 59 දෙනෙකුගෙන් අයවිය යුතු නිවාස කුලී රු.මිලියන 3.83 ක් 2015 වර්ෂයේ සිට අය වී නොතිබුණි.

(ඇ) 2012 වර්ෂය දක්වා නිලධාරීන් 14 දෙනෙකුගේ නිවාස කුලී වශයෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 7.18 ක් 2016 වර්ෂය දක්වාම අය කරගෙන නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2015 ජුනි මාසයේදී ජනාධිපති කාර්යාලය විසින් ලබාගත් නිවාසය සහ 2016 අප්‍රේල් මාසයේදී නීතිපතිතුමාට භාරදී තිබුණ නිවස සඳහා 2017 ජුනි මාසය දක්වා නිවාස කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.11 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 67 | 57 | 10 |
| (ii) | තෘතියික මට්ටම | 17 | 16 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 534 | 412 | 122 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 195 | 162 | 33 |
| | **එකතුව** | **813** | **647** | **166** |